**රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල.**

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් පාලන අරමුදලට ගෙවිය යුතු බැරකම් ගාස්තු ලෙස රු.71,200 ක මුදලක් ජංගම වගකීම් යටතේ පෙන්වා තිබුණද රබර් පාලන අරමුදලෙහි අවසන් ගිණුම් වල එවැනි ගණුදෙනුවක් ජංගම වත්කමක් යටතේ දක්වා නොතිබුණි.

(ආ) රබර් නැවත වගා කිරීමේ අරමුදලට අයත් රු.63,438,233 ක් වටිනා ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන නොතිබූ අතර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකරන මෙම වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.991,102 ක් ක්ෂය ලෙස ප්‍රතිපාදනය කර තිබුණි.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 63,438,233 | සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර වතක්ම් ලේඛනය, හිමිකම් ඔප්පු |
| නොපියවූ අත්තිකාරම් | 15,220,514 | විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| ලැබිය යුතු ශේෂ | 432,090,074 | මූලාශ්‍ර ලියවිලි , ශේෂ සනාථ කිරීම් |
| ගෙවිය යුතු ශේෂ | 32,179,804 | විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| එකතුව | 542,928,625 | |

1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම වත්කම් යටතේ දැක්වෙන රු.432,090,074 ක් වූ ශේෂ 13 ක් වසර 7 ක කාලයක් සිට හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.32,179,804 ක් වූ වගකීම් විෂයයන් 14 ක් වසර 06 ක පමණ කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන අතර මෙම වගකීම් නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයෙ මෙහෙයුම් කටයුතු වල ප්‍රතඵලය ලෙස රු.392,390 ක ඌනතාවයක් දැක්වූ අතර ඉකුත් වර්ෂයේ එය 131,822 ක් වූයෙන් ඌනතාවයෙ වැඩි වීම රු.261,068 ක් විය. කෙසේ වෙතත්, අරමුදලේ මුළු ආදායම ආයෝජන පොලී ආදායමෙන් පමණක් සමන්විත වූ අතර එය රු. 598,712 ක් විය.

## 2.2 කාර්යය සාධනය

### 2.2.1 අරමුදලේ පැවැත්ම

ක්‍රියාකාර තත්වයේ නොපවතින මෙම අරමුදල ඇවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ විගණිත ගිණුම්හි දැක්වෙන වත්කම් හා වගකීම් නිරවුල් කර එයට විගණකාධිපතිගේ එකඟතාවය ලබා ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. කෙසේ වෙතත් මෙම වාර්තාවේ දිනය වන විටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

### 2.2.2 අරමුදල් කළමණාකරණය

වර්ෂ ගණනාවක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින රු. 6,953,782 ක් වූ තැන්පත්හි ආයෝජිත මුදල්, අදාල පාර්ශ්වයන්ගෙන් ලත් විධිමත් අනුමැතියක් ඇතිව ඵලදායී ලෙස ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 03. අයවැය පාලනය

රබර් නැවත වගා සහනාධාර අරමුදල යටතේ වාර්ෂිකවවියදම් දැරීමක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 04. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන කෙෂ්ත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් පියවීම

(ඇ) ණයගැති/ ණයහිමි පාලනය

(ඇ) ස්ථාවර වත්කම්